**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහනේ (එස්පීඊඑන්ඩීපී) - 2014**

---

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහනේ (එස්පීඊඑන්ඩීපී) 2014දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර 2007 මැයි 08 දින එළඹි අංක 712-එල් කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 02 (අ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩ සටහනේ කාලය

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහනේ ණය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩ සටහනේ අරමුණු වන්නේ, ප්‍රතිලාභීන්ගේ ආයතනික ධාරිතාවය සහ ගනුදෙනු කුසලතා ශක්තිමත් කිරීම, කුඩා තේ හා රබර් වතු වවන්නන්ගේ ඉඩම් බුක්තිය වැඩි දියුණු කිරීම, අස්වනු භාරගැනීම, ගබඩා කිරීම, සකස් කිරීම හා නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම වර්ධනය කිරීම මගින් ඔවුන්ගේ ලාභය වැඩි කිරීම, ග්‍රාමීය මූල්‍ය හා ණය සේවා සංවර්ධනය හා පුළුල් කිරීම, සහ කාන්තාවන් විසින් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කරගැනීම හා දිළිඳු කම අඩු කරලන බවට තහවුරු කර ගැනීමයි.

ණය ගිවිසුම අනුව, වැඩ සටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,827.82 කට සමාන එජඩො මිලියන 29.22 ක් වන අතර ඉන් රු මිලියන 2,954.05 කට සමාන එ ජ ඩො මිලියන 22.5 ක් මූල්‍යායනය කිරීම සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල එකඟ වී තිබුණි. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතන හා වෙනත් ප්‍රතිලාභීන්ගෙන් අපේක්ෂිත දායකය පිළිවෙලින් රු. මිලියන 248.9 කට සමාන එ ජ ඩො 1.9 ක් හා රු. මිලියන 132.31 කට සමාන එ ජ ඩො මිලියන 1 ක් විය. වැඩ සටහන එහි කටයුතු 2007 නොවැම්බර් 06 දින ආරම්භ කරන ලද අතර වර්ෂ 7 ක කාල පරිච්ඡේදයක් තුළ නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2014 සැප්තැම්බර් 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී වැඩ සටහන් කාලය 2016 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩ සටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩ සටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩ සටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩ සටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩ සටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩ සටහන් වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් වැඩ සටහනේ ප්‍රගතිය, වැඩ සටහනේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩ සටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඍ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ.

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට වැඩ සටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව .

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින් වලට අනුකූල වූ බවත් ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව යටතේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| කෘ සං ජා අ | 22.55 | 2,954.05 | 561.60 | 3.14 | 425.77 | 16.33 | 1,924.54 |
| ශ්‍රී ලං ර | 3.76 | 492.56 | 38.40 | - | 29.67 | - | 149.17 |
| සහභාගීත්ව මූල්‍ය ආයතන | 1.90 | 248.90 | 26.75 | - | 23.09 | - | 86.97 |
| ප්‍රතිලාභීන්ගේ දායකය | 1.01 | 132.31 | 31.08 | - | 55.06 | - | 132.81 |
| එකතුව | 29.22 | 3,827.82 | 657.83 | 3.14 | 533.59 | 16.33 | 2,293.49 |

ඉහත තොරතුරු අනුව 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් වර්ෂ 07 ක් ඉකුත්වීමෙන් පසුව මුළු වෙන් කිරීමෙන් සියයට 72 ක් නියෝජනය වන එ ජ ඩො මිලියන 16.33 ක් වූ ණය මුදල් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ වර්ෂ 02 ක ඉතිරි කාල පරිච්ඡේදය තුළ එ ජ ඩො 6.22 ක් වූ ශේෂය උපයෝජනය කිරීමේ හැකියාව විගණනයේදී සැක සහිතවිය.

## 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම පළාත් උප වැඩ සටහන යටතේ මහනුවර, නුවරඑළිය හා කෑගල්ල දිස්ත්‍රික්කවල අඩු ඵලදායිතා භෝග පුනරුත්ථාපනය කිරීමට අභ්‍යන්තරික භෝග පැල බෙදාහැරීම සඳහා රු. මිලියන 1.5 ක මුදලක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට වෙන් කරදී තිබුණු අතර, ඉන් රු 936,658 ක මුදලක් හෙවත් සියයට 62.4 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට ඉහත වැඩ සටහනේ භෞතික ඉලක්ක සියයට 36 සිට සියයට 55 ක් පමණක් ඉටු කර ගෙන තිබුණු බව අනාවරණය විය.

(ආ) මධ්‍යම පළාත් උප වැඩ සටහන යටතේ එළු කිරි යෝගට් නිෂ්පාදනය සඳහා ප්‍රතිලාභියකුට 2013 ජූනි මාසයේදී රු 490,000 ක් වටිනා යෝගට් කෝප්ප සීල් කිරීමේ යන්ත්‍රයක් වැඩ සටහන විසින් සපයා තිබුණි. 2015 ජූනි වන විටත් ප්‍රතිලාභියා විසින් නිෂ්පාදනය ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) මොණරාගල උප වැඩසටහන විසින් පානීය ජල ළිං 20 ක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එම කාර්යය සඳහා රු 4,100,000 ක මුදලක් වෙන් කර තිබුණි. පානීය ජල ළිං 6 ක් ඉදිකිරීම සඳහා එකතුව රු. 144,000 ක අත්තිකාරම් ලබා දී තිබුණද, ළිං සඳහා තෝරාගත් ස්ථාන අපේක්ෂිත කාර්යයන් සඳහා සුදුසු නොවන බව විගණන ක්ෂේත්‍ර

විගණන පරික්ෂණයකදී අනාවරණය විය. 2015 අප්‍රේල් දක්වා ළිං එකක් හෝ සම්පූර්ණ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) වැඩ සටහනේ මධ්‍ය පළාත් උප වැඩ සටහන විසින් සමාලෝචිත වර්ෂය තුළ පුහුණු වැඩ සටහන් 178 ක් පැවැත්වීමට රු මිලියන 5.5 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද සියයට 38 ක් නියෝජනය වන පුහුණු වැඩ සටහන් 68 ක් පමණක් වර්ෂය අවසානයට පවත්වා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත මුදලින් රු මිලියන 3.36 ක මුදලක් හෙවත් සියයට 61 පමණක් උපයෝජනය කර තිබුණි.

(ඉ) මොණරාගල උප වැඩ සටහන යටතේ මොණරාගල හා බිබිලේ වන ව්‍යාප්ත ප්‍රදේශයේ මායිම් කණු 1,982 ක් සිටුවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැඩ සටහන විසින් රු 3,352,831 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වුවද 2014 මාර්තු දක්වා රු.1,400,000 පිරිවැයක් දරමින් කණු 587 ක් පමණක් සිටුවා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------

බුත්තල,උණවටුන මාර්ගයේ මීටර් 400 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවක් යටතේ මීටර් 300 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබූ බව විගණන පරීක්ෂණයකදී අනාවරණය විය. කෙසේ වුවද මාර්ගයේ මීටර් 400 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු 1,519,241 ක්වූ මුළු වෙන් කිරීමෙන් රු 1,122,085 ක් පමණක් වැය කර තිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

----------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩ සටහන විසින් වැය කරන ලද රු 1,374,024 ක් වූ ප්‍රවාහන වියදම් සහ රු 520,800 ක්වූ ප්‍රචාරණ වියදම් වැඩ සටහනේ අරමුණු ඉටු කර ගැනීම පිළිබඳ සෘජුවම අදාළ නොවූ ඒවා විය.

(ආ) මධ්‍ය පළාත් උප වැඩ සටහන විසින් 2010 වර්ෂයේ සිට බාහිර පාර්ශවයකින් කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබුණි. කුලී වාහන ලබා ගැනීම සඳහා වාර්ෂිකව මිල කැඳවීම් කර තිබූ අතර, වෙනත් වාහන සැපයුම්කරුවන්ගේ මිල සැඳහුම් සැලකීමෙන් තොරව පසුගිය වර්ෂ 5 සඳහා එම වාහන සැපයුම්කරුම තෝරාගෙන තිබුණි. 2010 සිට 2014 වර්ෂය දක්වා වැඩ සටහන විසින් රු 2,684,205 ක් වාහන කුලී ගාස්තු සඳහා වැයකර තිබුණි.